මගේ අංකය:-PS/EPC/MA02/paddy

2020 ජනවාරි මස 28 වන දින

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

**2019/20 මහ කන්නයේ වී අස්වනු මිලදී ගැනීමේ කඩිනම් වැඩපිළිවෙල**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක PS/EPC/Circular06/2020 හා 2020.01.24 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. උක්ත වැඩපිළිවෙල යටතේ තෙතමනය 14% ඉක්මවන 22% ට අඩු වී මිලදීගෙන වියලා ගැනීමේ ක්‍රියාවලියේදී වී තොග අඩු වීමේ හැකියාව තෙත වී කිලෝ ග්‍රෑම්100 කට කිලෝ ග්‍රෑම් 10-15 ක් අතර වන බව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් දන්වා ඇත. ඒ අනුව, මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේ දී ඒ පිළිබඳව සලකා කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

03. තවද, වී වියලා ගැනීමේ හා තොග පවත්වාගෙන යාමේදී එම ක්‍රියාවලින් වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව ඉටු කරලීම සඳහා වන පරිපාලන ක්‍රියාවලීන් සඳහා, උක්ත චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට යටත්ව කටයුතු කිරීමට අවසර දෙමි.

04. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව මා දැනුවත් කරන මෙන්ද තවදුරටත් දන්වා සිටිමි.

පී.ඩී ඉන්දිකා එල්. විජේගුණවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්
ආර්ථික ප්‍රතිපත්ති සහ සංවර්ධන සම්බන්ධීකරණ

අත්/කලේ. පී.බී ජයසුන්දර
ජනාධිපති ලේකම්